29 NOV 2022

22 JUN 2022

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය.**

**01. සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : පළාත් පාලන දෙපාර්තමේන්තුව(බ.ප.)
යොමු අංකය : LGD/02/21/03/02
දිනය : 2022.03.24

1.2 අමාත්‍යාංශය : පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප.)
යොමු අංකය : CMWP/ADM/0/01/1-3)
දිනය 2022.04.06

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම :
යොමු අංකය : DMS/D/පොදු/112
දිනය : 2012.12.19

1.4 ප්‍රධාන ලේකම්(බ.ප)ගේ නිර්දේශය :
යොමු අංකය : CSWP/PTR/11-1/F1/2-15
දිනය : 2022.06.01

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය :
දිනය :

1.6 බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : WPC/PSC/MNP/01/04/142
දිනය : 2022/11/01.

1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :
යොමු අංකය :
දිනය :

**02. පත්කිරීම් බලධරයා** - කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්

ක්‍රියාත්මක වන දිනය - ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.11.17

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය - ප්‍රාථමික අර්ධ ශිල්පීය

3.2 ශ්‍රේණි - III, II, I, විශේෂ

3.3 පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය - කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය කටයුතු පිළිබඳ ආයතනයන්හි කාර්යයන් ඉටුකිරීම හා පවත්වාගෙන යාමේදී අවශ්‍ය වන මූලික පහසුකම් සම්පාදනයට අදාළ වන සෞඛ්‍ය අංශවල ප්‍රධානීන් විසින් පවරනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අදාළව පැවරේ. මෙම කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් උපස්ථායිකා තනතුරට අදාළව විශේෂිත කොට දක්වනු ලබන කාර්යයන් තනතුරට පැවරේ.

3.4 කාර්යයන් පැවරීම - ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොවන අතර මෙම සේවා ගණයට අයත් කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත තනතුර දරන ඕනෑම ශ්‍රේණියක නිලධාරියෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන/ ආයතන ප්‍රධාන විසින් පවරනු ලැබිය හැකිය.

**04 තනතුරෙහි/තනතුරුවල ස්වභාවය** - ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය

**05 වැටුප්**

5.1 වැටුප් කේත අංකය - PL-2 2016 රා.ප.ච. 03/2016 අනුව

5.2 වැටුප් පරිමාණය - රු 25,250-10x270-10x300-10x330-12x350-38,450/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | 25250/- |
| II | පියවර 12 | 28250/- |
| I | පියවර 22 | 31280/- |
| විශේෂ ශ්‍රේණිය | පියවර 32 | 34600/- |

**06 සේවා ගණයට අයත් තනතුර /තනතුරු :**

6.1 අනුමත තනතුරු නාම ,අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : G.O.S./ADM/13/5/375
දිනය : 2022.11.17

29 NOV 2022

22 JUN 2022

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| උපස්ථායිකා | III/ II/ I/ සහ විශේෂ ශ්‍රේණිය | 36 | ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපස්ථායිකාවන්ගේ කාර්යයන්<br>• හෙද පාලිකාව ගේ අධීක්ෂණය යටතේ වාට්ටු හා සායන වල මකුළුදැල් කඩා, දූවිලි පිසදා වාට්ටු සහ සායනශාලා සෝදා පිරිසිදු කිරීම.<br>• වාට්ටුවල හා සායනශාලාවල ඇති දැව භාණ්ඩ පිරිසිදු කිරීම සහ සායනික උපකරණ සෝදා පිරිසිදු කිරීම.<br>• හෙද පාලිකාව ගේ අධික්ෂණය යටතේ ඇඳ ඇතිරිලි පවිත්‍ර කර නිසි පරිදි ඇඳන් සකසා තැබීම<br>• හෙද පාලිකාව ගේ අධික්ෂණය යටතේ වාට්ටුවේ නේවාසික රෝගීන් සඳහා අවශ්‍ය අවස්ථාවන් වලදී බෙඩ් පෑන් ලබා දීම, ඒවා පිරිසිදු කිරීම හා නිසි පරිදි අසුරා තිබීම.<br>• නේවාසික රෝගින් හට උදේ ආහාරය, දිවා ආහාරය, රාත්‍රී ආහාරය සඳහා සහ අවශ්‍ය අවස්ථාවලදී උණුකර නිවා ගත් පානීය ජලය ලබා දීම.<br>• නේවාසික රෝගීන් විසින් පාවිච්චි කරනු ලබන පිඟන්, කෝප්ප හා අනෙකුත් භාණ්ඩ සෝදා පිරිසිදු කිරිම.<br>• ප්‍රසූතිය සඳහා මව්වරුන් සූදානම් කිරීම හා ඒ සම්බන්ධ කටයුතුවලදී පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට සහාය වීම.<br>• ප්‍රසූතියෙන් පසු හෙද පාලිකාව ගේ උපදෙස් පරිදි අදාළ ඇඳන් සහ සූතිකාගාරය පිරිසිදු කිරීම.<br>• ළදරුවන් නැහැවීම සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට සහාය වීම.<br>• හෙද පාලිකාව ගේ උපදෙස් පරිදි සායන පැවැත්වීමට අදාළ පූර්ව සූදානම් කටයුතු කිරීම.<br>• සායනවලදී මව්වරුන් හා ළදරුවන් ගේ බර කිරීමේ දී පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට අවශ්‍ය සහාය වීම.<br>• දෛනිකව සිදු කරනු ලබන සායනික සේවා කටයුතුවලින් පසු හෙද පාලිකාව ගේ අධීක්ෂණය යටතේ සායනශාලා සෝදා පිරිසිදු කිරීම.<br>• බාහිර රෝගීන් සායන සඳහා පැමිණි විට පෙර රෝග විනිශ්චය පත්‍ර ,බෙහෙත් තුණ්ඩු, වෛද්‍ය වාර්තා ඇතුළත් ගොනු තේරීමේ කටයුතු සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියට සහාය වීම.<br>• දෙපාර්තමේන්තු ප්‍රධාන/ ආයතන ප්‍රධාන විසින් පවරනු ලබන රාජකාරියට අදාළ කටයුතු කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - 36

(ශ්‍රේණිගත උසස් විම් සඳහා 111/11/1 හා විශේෂ ශ්‍රේණි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් සේ සැලකේ.)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022-11-17

## 07 බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නොවේ |

සංලක්ෂය:
සීමිත ධාරාව යටතේ පවතින පුරප්පාඩු පිරවීමට නොහැකි අවස්ථාවලදී පමණක් විවෘතව (කාන්තා අයදුම්කරුවන්ගෙන් පමණක් ) අයදුම්පත් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

### 7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් හයකින් සමත්ව තිබීම.(මින් විෂයයන් පහක් (05) එක් වතාවකදී සමත් විය යුතුයි)

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.2.2.3 පළපුරුද්ද :

රජය හෝ රජයේ ලියාපදිංචි ආයතනයක හෝ සාත්තු සේවය / උපස්ථායක සේවය පිළිබඳ මාස හයකට (06) නොඅඩු කාල සීමාවක පුහුණුවක් ලබා තිබිය යුතුය

7.2.2.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙක්ම කොළඹ නාගරික බල ප්‍රදේශය තුළ සේවය කිරීමටත් තනතුරට අදාළ රාජකාරී කටයුතු ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

7.2.2.5 වෙනත් :

i. ශ්‍රී ලංකා පුරුවැසියකු විය යුතුය.
ii. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.11.17

29 NOV 2022

22 JUN 2022

iii. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව : අවු 18

7.2.3.2 උපරිම සීමාව : අවු 45

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත විභාගයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු ප්‍රමාණය මෙන් දෙගුණයක් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලබන අතර ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

7.2.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | අවම සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනීම | 100 | 40 |
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 |

විභාග විෂය නිර්දේශය (උප ලේඛන 01)

7.2.4.1.1 පවත්වන බලධරයා : පත්කිරීම් බලධරයා

7.2.4.2 ප්‍රායෝගික පරීක්ෂණය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | 100 | 40 |

විභාග විෂය නිර්දේශය (උප ලේඛනය 02)

7.2.4.2.1 පවත්වන බලධරයා : පත්කිරීම් බලධරයා

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.11.17

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ඉටුකරගැනීමට අපේක්ෂිත අරමුණු :
මූලික සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලැබේ. ලකුණු ලබා දෙනු නොලැබේ.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : පත්කිරීම් බලධරයා

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :

රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත්වල දැන්වීමක් පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ. ඊට අමතරව වෙබ් අඩවියේ ද දැන්වීම් පළ කළ හැකිය.

7.3 සීමිත බඳවා ගැනීම.

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස (සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් සමත්ව තිබීම.(මින් විෂයයන් පහක් (05) එක් වතාවකදී සමත් වී තිබිය යුතුයි)

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.3 පළපුරුද්ද :
කොළඹ මහා නගර සභාවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05)අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවය ස්ථිර කර ඇති සේවකයෙකු වීම.

7.3.2.4 කායික සුදුසුකම් :
තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත වීම.

7.3.2.5 වෙනත් :

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.11.17

29 NOV 2022
Provincial Public Service Commission
22 JUN 2022

කර තිබිය යුතුය. එමෙන්ම අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.

7.3.3 වයස

7.3.3.1 අවම සීමාව : } දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතුවූවන්ගෙන්
7.3.3.2 උපරිම සීමාව : } බඳවා ගන්නා බැවින් වයස් සීමාව අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :

ප්‍රයෝගික පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහලම ලකුණු ලබා ගන්නා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

සටහන :- තෝරා ගනු ලබන සේවක සේවිකාවන්ට තුන් මසක පුහුණුවක් ලබා දෙනු ලැබේ. පුහුණු කාලය තුළ විභාග වලින් අසමත් වන්නාවූ හෝ පුහුණු ආයතනයේ විනය, නිවාඩු පිළිබඳ නීති නොපිළිපදින්නා වූ හෝ සේවිකාවන් ඔවුන් මුලින් දැරූ තනතුරුවලට ආපසු යවනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.3.4.2 ප්‍රායෝගික පරීක්ෂණය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | අවම සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | 100 | 40 |

විභාග විෂය නිර්දේශය (උප ලේඛනය 02)

7.3.4.2.1 ප්‍රායෝගික පරීක්ෂණය පවත්වන බලධරයා : පත්කිරීම් බලධරයා

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ :

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :
මූලික සුදුසුකම් පරික්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරික්ෂා කිරීම.
සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු ප්‍රයෝගික පරික්ෂණයේ දී ම සලකා බලනු ලැබේ.

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : පත්කිරීම් බලධරයා

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.11.17

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>7.3.2. හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයේ දී ලබා ගෙන ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙකක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>සාමාන්‍ය සාමාර්ථයකට ලකුණු -4<br>සම්මාන සාමාර්ථයකට ලකුණු -6<br>අධිසම්මානයකට ලකුණු -8<br>විශිෂ්ට සම්මානයකට ලකුණු -10 | 20 | අදාළ නොවේ. |
| 2 | පලපුරුද්ද<br>ඉහත 7.3.2.3. යටතේ සඳහන් අනිවාර්ය සේවා කාලයට අමතරව සේවා කාලය<br>(වසරකට ලකුණු 10 බැගින් වසර 05 ක් සඳහා | 50 | |
| 3 | තනතුරට අදාළ රාජකාරි පිළිබඳ දැනුම | 15 | |
| 4 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය (සාමාන්‍ය දැනීම, සන්නිවේදන කුසලතාවය) | 10 | |
| 5 | පෞරුෂත්වය | 05 | |
| 6 | එකතුව | 100 | |

7.3.4.4.1 ව්‍යුහගත පරීක්ෂණය පවත්වන බලධරයා - පත්කිරීම් බලධරයා

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :
අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමේ නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.12.17

Provincial Public Service Commission
29 NOV 2022
22 JUN 2022

08 කාර්යක්ෂමතා කඩඉම්.

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම් සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ( වාචික/ ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත්) |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගත වීමට පෙර | වාචික පරීක්ෂණ (උපලේඛන 03) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස් වී වසර 03ක් ගතවීමට පෙර | වාචික පරීක්ෂණ (උපලේඛන 04) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර පහ 05 ක් ගතවීමට පෙර | වාචික පරීක්ෂණ (උපලේඛන 05) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද? වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද?

1 වන කාර්යක්ෂමතා කඩඉම
2 වන කාර්යක්ෂමතා කඩඉම
3 වන කාර්යක්ෂමතා කඩඉම
} පත්කිරීම් බලධරයා විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මඟින්

09. භාෂා ප්‍රවීණතාවය.

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුන නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ දී ලබා ගත යුතුය. |
| 2.අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3.සන්ධාන භාෂාව | අදාළ නොවේ. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.11.17

## 10. ශ්‍රේණි උසස් කිරීම.

### 10.1 සේවා ගණයෙහි III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම.

#### 10.1.1 සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම.

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.
II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාල සියලුම වැටුප් වර්ධක 10 ක් උපයාගෙන තිබීම .
III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.
VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස්කිරීමේ ක්‍රමය :
සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම් අංක 01 ) අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලැබේ.

### 10.2 සේවාගණයෙහි II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

#### 10.2.1 සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාල සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
II. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.11.17

29 NOV 2022
Public Service Commission
22 JUN 2022

10.2.1.2 උසස්කිරීමේ ක්‍රමය :
සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම් අංක 01) අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 1 ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලැබේ.

10.3 සේවා ගණයෙහි I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

1. සේවා ගණයේ 1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09)ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාල සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
2. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර(05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
3. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

10.3.1.2 උසස්කිරීමේ ක්‍රමය :
සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම් අංක 01) අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සම්පූර්ණ කරන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම් සිදු කරනු ලැබේ.

**11.** **තනතුරුවලට පත් කිරීම :** අදාළ නොවේ.

**12.** **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද, ආයතන ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.11.17

**13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ :**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය:**

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින සියලුම දෙනා ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ වැටුප් පරිවර්තන ක්‍රමවේදය අනුව පහත සඳහන් පරිදි නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. එහෙත් අන්තර්ග්‍රහණය හේතුවෙන් වැටුප් වර්ධක දිනයේ වෙනසක් සිදු නොවන අතර,එම අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය නොවෙනස්ව ක්‍රියාත්මක වේ. එසේම අනුරූපී වැටුප් පියවරක් හිමිවීම හේතුකොට ගෙන ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදුකරනු නොලැබේ.

ඉහත විධිවිධාන පරිදි අදාළ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමෙන් අනතුරුව එකී ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය අවම සේවා කාලයට වැඩියෙන් සේවය කර ඇති කාල සීමාව ඊළඟ ශ්‍රේණියට උසස් කිරීමේ දී අවශ්‍ය සේවා කාලයට එකතු කරනු ලැබේ.

මෙම පරිපාටිය යටතේ අන්තර්ග්‍රහණය කරන ලද සේවකයින් අන්තර්ග්‍රහණය කරන ලද ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු වන අතර ඒ සඳහා වසර 03 ක සහන කාලයක් ලබා දෙනු ඇත.

**III වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :**

මෙම බඳවා ගැනීම් පරිපාටිය අනුමත වන දිනට ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන උපස්ථායිකා තනතුරක 111 වන ශ්‍රේණියේ සේවය කරන සේවිකාවන් මෙම පරිපාටියට අනුව ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා 111 වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

**II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :**

මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන දිනට ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන උපස්ථායිකා තනතුරක II ශ්‍රේණියේ සේවය කරන සේවිකාවන් මෙම පරිපාටියට අනුව ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා 11 වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

**I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :**

මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන දිනට ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන උපස්ථායිකා තනතුරක I ශ්‍රේණියේ සේවය කරන සේවිකාවන් මෙම පරිපාටියට අනුව ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා 1 වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.11.17

Provincial Public Service Commission
29 NOV 2022
22 JUN 2022

**විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :**

මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන දිනට ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන උපස්ථායිකා තනතුරක විශේෂ ශ්‍රේණියේ සේවය කරන සේවිකාවන් මෙම පරිපාටියට අනුව ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

සටහන :
ඉහත අංක 14 පරිදි අන්තර්ග්‍රහණය කළ නිලධාරීන් අන්තර්ග්‍රහණය කළ ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ යුතු අතර දැනටමත් පෙර අනුමත පරිපාටිය අනුව අදාළ ශ්‍රේණියට අයත් කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කර තිබේනම් නව පරිපාටිය යටතේ අන්තර්ග්‍රහණය වූ ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වීම අවශ්‍ය නැත.

**15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධව ගැටළු පැනනගින අවස්ථාවකදී හා/හෝ මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.**

**16. අර්ථ නිරූපණ :**

සතුටුදායක සේවා කාලය

පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මඟින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත් වීම මඟින් ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මඟින් ද, එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලු ම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

නිලධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නිත්‍යානුකූල හේතු මත අත්හිටුවා , අඩු කොට නතර කොට හෝ විලම්බනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එයද, ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ හෝ බස්නාහිර පළාත් විනය කාර්ය පරිපාටියේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03ක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ හෝ, බස්නාහිර පළාත් විනය කාර්ය පරිපාටියේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේ දී බැහැර කළ යුතු වන්නේය.

සක්‍රිය සේවා කාලය :

"සක්‍රිය සේවා කාලය " යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022 .11 . 17

<u>නියමිත දිනට :</u>

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු දිනය , " නියමිත දිනය " ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් වන නිලධාරීන්ට බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි උසස් වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන් ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

උදා - වසර තුනක දී සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම වසර හතරකින් සමත් වුවහොත් වසර දහයකින් ලැබිය යුතු උසස් වීම ලැබෙනුයේ වසර එකොළහකිනි.

සකස් කළේ: ........................

නම : කේ.ඩී.එම්.එම්.එස්. සෙනෙවිරත්න

තනතුර : පරිපාලන නිලධාරි

දිනය : පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

පරීක්ෂා කළේ :........................

(විෂයභාර මාණ්ඩලික නිලධාරියා)

නම :

තනතුර : ජී. ඩී. ඒ. ස්වර්ණලතා

දිනය : නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත

අත්සන ........................

(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම :

තනතුර : ඒ.ඩී.පී.අයි. ප්‍රසන්න

දිනය : පළාත් පාලන කොමසාරිස්

නිලමුද්‍රාව : පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)

යොමු අංකය: CNWP/ADM/6/01/31

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය : 2022.04.08

අත්සන :........................

(පළාත් පාලන ලේකම්)

නිලමුද්‍රාව: ඒ. ඩී. එස්. සදිකා
ලේකම්
පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය (බ.ප.)
අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.11.17

29 NOV 2022



22 JUN 2022

යොමු අංකය: CSWP/PTR/11-1/F1/2-15

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය : ..................................

අත්සන : ..................................

ප්‍රධාන ලේකම් (බ.ප.) 6/01

නිලමුද්‍රාව

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත)
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල

යොමු අංකය: ..................................

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය : 2022/11/01

අත්සන : ..................................

ලේකම් (පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව)

නිලමුද්‍රාව

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

යොමු අංකය: WPC/PSC/MNP/01/04/142

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය 2022.11.17 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

දිනය : 2022.11.17

අත්සන : ..................................

ආණ්ඩුකාර ලේකම් (බ.ප.)

නිලමුද්‍රාව

ජී. ෂෙරමයිර්
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාත් ආණ්ඩුකාර කාර්යාලය
10 වන ... ... ගොඩනැගිල්ල
අංක. 204, ... කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

අංකය : Gov/ADM/13/5/375

දිනය : 2022.11.17

උපලේඛන අංක: 01

**<u>බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා තනතුර සඳහා බඳවා ගැනීමේ ලිඛිත විභාගය (විවෘත)</u>**

01. විභාගයේ නම : බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා තනතුර සඳහා බඳවා ගැනීමේ ලිඛිත විභාගය (විවෘත)

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය/ විෂය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණ |
|---|---|---|---|
| සාමාන්‍ය දැනුම | පැය 01 | 100 | 40 |
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

03.පවත්වනු ලබන බලධරයා : පත්කිරීම් බලධරයා විසින්

04.පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : පුරප්පාඩු ඇති වූ අවස්ථාවල දී

05.විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය දැනුම | ජාතික, කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ පවතින සාමාජයීය, සංස්කෘතික, අධ්‍යාපන විද්‍යාත්මක දේශපාලනික, මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි. |
| බුද්ධි පරීක්ෂණය | සාමාන්‍ය බුද්ධිය හා තර්කන ශක්තිය මැන බැලීම සඳහා ගණිතමය ගැටලු ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි. |

අත්සන ........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම ........................................
තනතුර ........................................
දිනය ........................................
නිලමුද්‍රාව

ඒ.ඩී.පී.අයි. ප්‍රසන්න
පළාත් පාලන කොමසාරිස්
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.11.17

29 NOV 2022

22 JUN 2022

උපලේඛන අංක: 02

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා තනතුර සඳහා බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය (විවෘත/ සීමිත)**

01. විභාගයේ නම : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා තනතුර සඳහා බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය (විවෘත/ සීමිත)

2. විභාගය පිළිබඳ විස්තර :

| විෂයයන් | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණ |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | පැය 01 වි.30 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : පත්කිරීම් බලධරයා විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : පුරප්පාඩු ඇති අවස්ථාවල දී

05.විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ දැනුම | ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම, උපකරණ සවිකිරීම් සහ අළුත්වැඩියා කිරීම් පිළිබඳ දැනුම,අදාළ ක්ෂේත්‍රයේ උපකරණවල දෝෂ හඳුනාගැනීම සහ ක්ෂේත්‍රයට අදාළ උපකරණ භාවිතය පිළිබඳව දැනුම |

අත්සන ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම ..............................

තනතුර ..............................

දිනය ..............................

නිලමුද්‍රාව

ඩී.පී.අයි. ප්‍රසන්න
පළාත් පාලන කොමසාරිස්
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
... අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.11.17

උපලේඛන අංක: 03

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා 111 ශ්‍රේණිය සඳහා 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (වාචික)**

1. විභාගයේ නම : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා 111 ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (වාචික)

2. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය /විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණ |
|---|---|---|---|
| තනතුරට අදාළ රාජකාරි පිළිබඳ දැනුම හා කාර්යාල කටයුතු සම්බන්ධ වූ මූලික දැනුම පරීක්ෂා කිරීම. | පැය 01 වි. 30 | 100 | 40 |

3. පවත්වනු ලබන බලධරයා : පත්කිරීම් බලධරයා විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| තනතුරට අදාළ රාජකාරි පිළිබඳ දැනුම හා කාර්යාල කටයුතු සම්බන්ධ වූ මූලික දැනුම පරීක්ෂා කිරීම. | • තනතුරට අදාළව පැවරී ඇති රාජකාරී විෂය පථය සම්බන්ධයෙන් සේවිකාව සතු අවබෝධය පරීක්ෂා කිරීම.<br>• පත්කිරීම් ලිපිය, පරිවාස කාලය, රාජකාරි වේලාව, නිවාඩු, වැටුප් වර්ධක හා නිල ඇඳුම් පිළිබඳ සේවිකාවගේ මූලික දැනුම පරීක්ෂා කිරීම |

අත්සන ..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)
නම ........ඒ.ඩී.පී.අයි. ප්‍රසන්න........
තනතුර ........පළාත් පාලන කොමසාරිස්........
දිනය ....පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ:ප:)....
නිලමුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022-11-17

22 JUN 2022

29 NOV 2022

උපලේඛන අංක: 04

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා 11 ශ්‍රේණිය සඳහා 11 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (වාචික)**

**1.** විභාගයේ නම : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා 11 ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (වාචික)

**2.** විභාගය පිළිබඳ විස්තර:

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණ |
|---|---|---|---|
| ආයතන කාර්ය පරිපාටිය | පැය 01 වි. 30 | 100 | 40 |

**3.** පවත්වනු ලබන බලධරයා : පත්කිරීම් බලධරයා විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්

**4.** පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

**5.** විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන කාර්ය පරිපාටිය | ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VII,XII,XXIII ආශ්‍රයෙන් සකස් කළ කෙටි ප්‍රශ්නාවලියකින් සමන්විත වේ. |

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ..............................
තනතුර: ..............................
දිනය : ..............................
නිලමුද්‍රාව

ඒ.ඩී.පී.අයි. ප්‍රසන්න
පළාත් පාලන කොමසාරිස්
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)

... ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.11.17

උපලේඛන අංක: 05

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා 1 ශ්‍රේණිය සඳහා 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (වාචික)**

1. විභාගයේ නම : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා 1 ශ්‍රේණිය සඳහා 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (වාචික)

2. විභාගය පිළිබඳ විස්තර :

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| තනතුරට අදාළ රාජකාරි පිළිබඳ දැනුම හා ආයතන කටයුතු පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම | පැය 01 වි. 30 | 100 | 40 |

3. පවත්වනු ලබන බලධරයා : පත්කිරීම් බලධරයා විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| තනතුරට අදාළ රාජකාරි පිළිබඳ දැනුම හා ආයතන කටයුතු පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම. | • සේවිකාව ගේ රාජකාරි විෂය පථයට අදාළව පැවරී ඇති රාජකාරි කටයුතු සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළුවක් සේවිකාව විසින් අවබෝධ කරගන්නා ආකාරය හා ඊට ලබාදෙන පිළිතුරු හා ඊට මුහුණ දෙන ආකාරය මෙහිදී සලකා බැලේ.<br>• රැකියා විස්තරය, සේවිකාව සතු වගකීම, සේවය ස්ථිර කිරීම සඳහා සපුරාලිය යුතු කරුණු, වැටුප් වර්ධක උපයා ගැනීම, දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර හිමිකම, රජයේ සේවකයෙකු වශයෙන් පිළිපැදිය යුතු විෂය කරුණු පිළිබඳ අවබෝධය |

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ..............................
තනතුර: ....ඒ.ඩී.පී.අයි. ප්‍රසන්න....
දිනය : ....පළාත් පාලන කොමසාරිස්....
නිලමුද්‍රා පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : Gos/ADM/13/5/375
දිනය : 2022-11-17

Provincial Public Service
29 NOV 2022
22 JUN 2022

ඇමුණුම : 01

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ උපස්ථායිකා තනතුරට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ II/I/විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලබා ගැනීම සඳහා වූ අයදුම්පත**

1. නිලධාරයා පිළිබඳ තොරතුරු

   1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..................................................................

   1.2 ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................

   1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ..................................................................

   1.4 අයත් වන සේවය හා තනතුර : ..................................................................

   1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : ..................................................................

2. පත්වීම පිළිබඳ තොරතුරු

   2.1 පත්කිරීම් දිනය : ..................................................................

   2.2 පත්වීම ස්ථිර කළ දිනය : ..................................................................

   2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

   2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

3. උසස්වීමට අදාළ තොරතුරු

   3.1 උසස්වීමට අපේක්ෂිත ශ්‍රේණිය : II / I / විශේෂ

   3.2 උසස්වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍යය

   3.3.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත

   3.3.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය ..................................................

   3.3.3 අපේක්ෂිත සක්‍රියසේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට අදාළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කරතිබේද? ඔව් / නැත

ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.11.17

3.3.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව් / නැත
උසස්වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත

3.3.5 විනය දඬුවම් ලබා තිබේද ? ඔව් / නැත

4. <u>අයදුම්කරුගේ ප්‍රකාශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ............................ දින සිට සාමාන්‍ය කාර්යසාධනය යටතේ II / I ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

| | |
|---|---|
| ........................................ | ............................................................ |
| දිනය | නිලධරයා ගේ අත්සන |

5. <u>අංශ ප්‍රධානි / දෙපාර්තමේන්තු ප්‍රධානිගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම් සඳහන් ..................................... මහතා/ මිය/ මෙනවිය ............................ සේවා ශ්‍රේණියේ ............................ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවටත්, සෑහීමකට පත්වෙමි. ඒ අනුව එම නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

නම : ..................................................
අත්සන : ..................................................
දිනය : ..................................................
නිල මුද්‍රාව :..................................................

6. <u>නාගරික කොමසාරිස්ගේ අනුමැතිය</u>

දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් ඉහතින් දක්වා ඇති කරුණු අනුව ඉහත නිර්දේශය හා එකඟ වන අතර ඒ අනුව ...................................................... මහත්මිය/මෙනෙවිය උපස්ථායිකා තනතුරේ ....................... ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ .................................. දින සිට උසස් කිරීම අනුමත කරන බව කාරුණිකව දන්වමි.

නම : ..................................................
අත්සන : ..................................................
දිනය : ..................................................
නිල මුද්‍රාව :..................................................

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/13/5/375
දිනය : 2022.11.17